www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප ජනාධිපති අපේක්ෂක බිල් වෑන් ඕකන් ශ්‍රී ලංකාවේ දී දකුනු ආසියානු මාධ්‍ය අමතයි

**SEP presidential candidate Bill Van Auken speaks to South Asian press in Sri Lanka**

**වාර්තාකරුවකු විසිනි**
**2004 ඔක්තෝබර් 21**

එක්සත් ජනපද ජනාධිපතිවරනයේ සමාජවාදී සමානතා පක්ෂයේ අපේක්ෂක බිල් වෑන් ඕකන් බදාදා කොලඹ දී පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී ශ්‍රී ලංකා, ඉන්දියානු හා පකිස්තාන පුවත්පත් නියෝජනය කරන මාධ්‍යවේදීන් 20කට වැඩි පිරිසක් ඇමතී ය. ශ්‍රී ලංකාවේ ස්වර්නවාහිනී රූපවාහිනී නාලිකාව ප්‍රවෘත්ති සාකච්ඡාව රූගත කොට රාත්‍රී 8ට විකාශනය කරන සිය ප්‍රවෘත්ති වැඩසටහන තුල මිනිත්තු ගනනාවක වාර්තාවක් ප්‍රචාරය කලේ ය. වෑන් ඕකන්ගේ කතාවෙන් උපුටා ගත් කොටස් වාර්තාවට ඇතුලත් වූ අතර එක්සත් ජනපදය ඉරාකයේ සිදු කල ආක්‍රමනය යුද අපරාධයක් ලෙස හඳුන්වමින් ඔහු කල ප්‍රකාශය ද එහි අන්තර්ගත විය.

*ඔබ්සවර්, සන්ඩේ ටයිම්ස්, ඩේලි මිරර්, දි අයිලන්ඩ්, ඩේලි නිව්ස්, වීරකේසරී, ලංකාදීප* සහ *ලක්බිම* ඇතුලත් ඉංග්‍රීසි, සිංහල සහ දෙමල මාධ්‍යයෙන් පල වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුවත්පත්වල නියෝජිතයෝ ප්‍රවෘත්ති සාකච්ඡාවට පැමින සිටියහ.

ඉන්දියාවේ දිනපතා පත්‍රයක් වන *හින්දු* සහ *ෆ්‍රන්ට්ලයින්* සඟරාවේ ද පකිස්තානයේ දිනපතා *ඩෝවින්* පත්‍රයේ මෙන් ම එරට විශාලතම ප්‍රවෘත්ති ඒජන්සිය වන නිව්ස් නෙට්වර්ක් ඉන්ටර්නැෂනල් ආයතනයේ ද වාර්තාකරුවෝ පැමින සිටියහ.

ශ්‍රී ලංකා සසපයේ ජාතික ලේකම් විජේ ඩයස් ප්‍රවෘත්ති සාකච්ඡාව අරඹමින් වෑන් ඕකන් හඳුන්වා දුන්නේ ය. වෑන් ඕකන් ඔක්තෝබර් 23 වන සෙනසුරාදා කොලඹ දී ද ඔක්තෝබර් 25 වන සඳුදා මහනුවර දී ද පැවැත්වෙන සසප රැස්වීම්වල කතා කරනු ඇත.

2004 එක්සත් ජනපද මැතිවරනය තුල සසපයේ මැදිහත්වීමට යටින් දිවෙන ජාත්‍යන්තර ඉදිරිදර්ශනය පැහැදිලි කරමින් වෑන් ඕකන් සිය කතාව ඇරඹී ය: "ඇමරිකාවේ මැතිවරන දිනට යන්තම් සති දෙකක් තිබිය දී මගේ පක්ෂය සිය අපේක්ෂකයා ආමන්ත්‍රන සංචාරයක් සඳහා විදේශයන්ට යැවීමට එකඟ වූයේ ඇයි ද යන්න අරබයා මෙහිත් එක්සත් ජනපදය තුලමත් ප්‍රශ්න පවතින බව මම දනිමි. කෙසේ වෙතත්, අපට නම්, නොවැම්බර් 2 මැතිවරනය හුදු ඇමරිකානු සිද්ධියක් නො වන බවත්, එය ලොව පුරා වැඩ කරන ජනතාව සම්බන්ධයෙන් ඉමහත් වැදගත්කමක් සහිත සිද්ධියක් බවත් පැහැදිලි ය."

වෑන් ඕකන් තව දුරටත් මෙසේ සඳහන් කලේ ය: "එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ආර්ථික හා මිලිටරි පිලිවෙත්වල ලෝක පරිමාන දැවැන්ත හා නිෂේධනීය බලපෑම සැලකිල්ලට ගත් කල එක්සත් ජනපද ජනාධිපතිවරනයක දී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ශ්‍රී ලංකාවේ හා සෙසු රටවල ජනතාවට ලබා දීම මුලුමනින් ම යුක්තියුක්ත වනු ඇතැයි අපි සඳහන් කර ඇත්තෙමු. ඒ හුදෙක් එයින් ඇති කෙරෙන බලපෑම හේතු කොට ගෙන නො වේ."

එක්සත් ජනපදය ඉරාකයේ සිදු කල ආක්‍රමනයේත් එහි පවත්වා ගෙන යන වාඩිලෑමේත් සාපරාධී හා ඉව බවක් නැති ව්‍යසනකාරී ස්වභාවය පෙන්වා දුන් සසප අපේක්ෂකයා මහ ව්‍යාපාරික පක්ෂ දෙක වන රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් පක්ෂත් ඔවුන්ගේ අපේක්ෂකයන් වන ජෝර්ජ් බුෂ් හා ජෝන් කෙරී යන දෙදෙනාත් ඉරාකයේ වාඩිලෑම දිගටම පවත්වා ගෙන යාමටත් ඉරාක ජනතාවගේ ප්‍රතිරෝධය තලා දැමීමටත් මුලුමනින් ම කැප වී සිටින බව ද සඳහන් කලේ ය.

"ඉරාකයේ දී එක්සත් ජනපද ආන්ඩුව ගෙන යන්නේ විවෘත විජිතවාදී ආක්‍රමනයේ යුගයට පරාගත වීමක් නියෝජනය කරන්නා වූ ද සමස්ත ලෝකයේ ම මහජනතාවන්ට තර්ජනය කරන්නා වූ ද යුද්ධයකි.... එක්සත් ජනපදයේ පක්ෂ දෙක ම විසින් මෙම යුද්ධය සාධාරනීකරනය කරනු පිනිස දෙනු ලැබූ හේතු — මහා ජන නාශක අවි සහ සදාම් හුසේන්ට අල් කයිඩා සංවිධානය සමග පැවතියේ කියනු ලැබූ සබඳතා — එක්සත් ජනපද ආන්ඩුව විසින් ම සකසනු ලැබූ වාර්තා මගින් පවා පිලිගනු ලැබූ පරිදි, බොරු බව ඔප්පු වී තිබේ. දැන් ඉතිරිව පවත්නේ සැබෑ හේතුව යි — එනම්, ඉරාක තෙල් සංචිත අත්පත් කර ගැනීම මගින් එක්සත් ජනපද ආධිපත්‍යය තහවුරු කර ගැනීමේ ප්‍රයත්නය යි.

"ඉරාකයෙන් සියලු එක්සත් ජනපද හමුදා වහා ම හා කොන්දේසි විරහිතව ඉවත් කර ගත යුතු යයි ඉල්ලා සිටින්නේ අපගේ පක්ෂය පමනි. මෙය වනාහි ඇමරිකාවේ කෝටි සංඛ්‍යාත ජනතාවගේ සහයෝගය ලැබෙන ඉල්ලීමකි. එහෙත් ඔවුන්ගේ මනෝගතීන් සංගත විසින් පාලනය කෙරෙන පක්ෂ වන ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂවල පිලිවෙත් තුල

කිසිදු අයුරකින් නියෝජනය නො වේ."

ඉරාක යුද්ධය හා ඊනියා "ත්‍රස්ත විරෝධී යුද්ධය" හේතු කොට ගෙන එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ලෝකයේ වඩාත් ම අස්ථාවරකරන බලය බවට පත්ව ඇතැයි වැන් ඕකන් සඳහන් කලේ ය. ශ්‍රී ලංකාවේ හා තවත් බොහෝ රටවල ජීවන වියදම නාටකාකාර ලෙස ඉහල යාමට හේතු වී ඇති තෙල් මිල ගනන් ශීඝ්‍රයෙන් නැගීම ද එක්සත් ජනපද ආන්ඩුවේ ඉව බවක් නැති මිලිටරිවාදයේ එක ප්‍රතිවිපාකයක් පමනි.

"එක්සත් ජනපදයේ කම්කරුවන්ගේ අවශ්‍යතා ශ්‍රී ලංකවේ හා අන් සෑම රටකම කම්කරුවන්ගේ අවශ්‍යතා සමග අවියෝජනීය ලෙස බැඳී ඇති බව අපි අවබෝධ කර ගෙන සිටිමු. අන්තර් ජාතික සංගත කම්කරු අයිතීන් ක්ෂමා විරහිතව පාගා දමන නිදහස් වෙලඳ කලාප නිර්මානය කිරීමට අනුග්‍රහය දක්වමින් ලාභ ම හා වඩාත් ම පහසුවෙන් සූරාකෑ හැකි ශ්‍රමය සොයමින් ලෝක ගෝලය සිසාරා යයි."

එක්සත් ජනපදය තුල කම්කරුවන්ගේ වැටුප්, රැකියා සහ සේවා කොන්දේසි මත එල්ල කෙරෙන සදා නො නවතින ප්‍රහාර කෙරෙහි වැන් ඕකන් අවධානය යොමු කලේ ය. "ලෝකය වටා සිටින ඔවුන්ගේ සගයන්ට මෙන් ම එක්සත් ජනපදයේ සිටින කම්කරුවන්ට කියනු ලබන්නේ ඔවුන් අඩු වැටුප් හා නරක සේවා කොන්දේසි පිලිගන්නේ නැති නම් සංගත ඊටත් වඩා ලාභ ශ්‍රමය පවත්නා වෙනත් රටකට සිය නිෂ්පාදන මෙහෙයුම් නිකම් ම මාරු කරනු ඇති බව යි.

"මෙම ගැටලුවලට ජාතික විසඳුමක් නොමැත. ජාතික දේශ සීමා හරහා කම්කරුවන්ගේ අරගල ඒකාබද්ධ කිරීමක් එය ඉල්ලා සිටී. අප සෙසු රටවල කම්කරුවන් දෙස හැරී එක්සත් ජනපද මැතිවරනය තුල ඔවුන්ගේ අවශ්‍යතාවන් ප්‍රකාශයට පත් කිරීමට උත්සාහ දරන්නේ ඒ නිසයි."

ශ්‍රේෂ්ඨාධිකරනයේ අධිකාරවත් නියමයක් මගින් බුෂ් ජනාධිපති ලෙස පත් කිරීම, ත්‍රස්ත විරෝධී යුද්ධයේ නාමයෙන් පොලිස් හා ජනාධිපති බලතල දැවැන්ත ලෙස පුලුල් කිරීම, සහ ඔහියෝ ප්‍රාන්තය තුල ප්‍රජාතන්ත්‍ර විරෝධී හා හිතුවක්කාරී ලෙස සසපට ඡන්ද අපේක්ෂක අයිතිය ප්‍රතික්ෂේප කිරීම, එක්සත් ජනපද දේශපාලන ක්‍රමය ලෝකයාට ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රදීපස්ථම්බයක් ය යන කියාපෑම බොරුවක් බව ඔප්පු කර ඇතැයි සසප අපේක්ෂකයා පැවසී ය.

"දකුනු පලාත්වල ජනයා වාර්ගික පදනමකින් වෙන් කිරීමේ පිලිවෙත ක්‍රියාත්මක වූ කාලයෙන් පසුව දක්නට නො ලැබුනු පරිමානයකින් ඇමරිකාවේ ජනයාට ඡන්දය දීමේ අයිතිය අහිමි කිරීමේ ප්‍රයත්නයන්ට එරෙහිව දැනටමත් විරෝධතා ව්‍යාපාර ඇරඹී තිබේ.

"ඉතා අසීරු අරගලයක් හරහා, මිලියන 40ක ඒකාබද්ධ ජනගහනයකින් යුත් ප්‍රාන්ත අටක අපගේ අපේක්ෂකයන්ගේ නම් ඡන්ද පත්‍රිකාවන්ට ඇතුලු කර ගැනීමට අපට හැකි වී ඇත. තෙවන පක්ෂයක අපේක්ෂකයන්ගේ නම් ඡන්ද පත්‍රිකාවලට ඇතුලු වීම වලකාලීමට යොදා ගැනෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී නීතිවලට අමතරව, — ප්‍රාන්ත 50 ම ඡන්ද අපේක්ෂක තත්වය ලබා ගනු පිනිස අඩු ගනනේ ඡන්දදායකයන් මිලියනයක අත්සන් අවශ්‍ය ය — ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂ, අපට ඡන්ද අපේක්ෂකත්වය ලබා දීමට අවශ්‍ය ඡන්දදායකයන්ගේ නීති යුක්ත පෙත්සම් විසි කර දමමින්. අපට ඡන්ද අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කිරීමට නීතියෙන් පිටස්තර විධි ක්‍රම යොදා ගෙන තිබේ."

සිය ප්‍රකාශය සමාප්ත කරමින් වැන් ඕකන් පැහැදිලි කලේ, මහ ව්‍යාපාරිකයන් දේශපාලන බලය මත්තේ ඒකාධිකාරය පවත්වා ගෙන යාමට යොදා ගන්නා රාජ්‍ය අනුග්‍රහය ලැබෙන ද්වි-පක්ෂ ක්‍රමය පෙරලා දැමීම සසප උද්ඝෝෂනයේ එල්ලය වන බව යි. "අප සටන් වදින්නේ ඇමරිකාවේ දේශපාලන විවාදයේ මට්ටම ඉහල දැමීමට, ඩිමොක්‍රැටික් හෝ රිපබ්ලිකන් පක්ෂ දෙකෙන් එකක් මගින් වත් නියෝජනය නො කෙරෙන අවශ්‍යතා සහිත වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා ප්‍රකාශයට පත් කිරීමට සහ එලඹෙන බව අප දන්නා අනාගත අරගල සඳහා සූදානම් වීමට ය. අපගේ උද්ඝෝෂනය එක්සත් ජනපදයේ කම්කරුවන්ගේ දේශපාලන අධ්‍යාපනයටත් ලොව වටා කම්කරු පන්තිය තුල බලගතු ජාත්‍යන්තර සමාජවාදී සංස්කෘතියක් යලි ගොඩනැගීමටත් සැලකිය යුතු ආකාරයකින් ප්‍රතිපදානයන් කරනු ඇති බවට අපි ඒත්තු ගෙන සිටිමු."

වැන් ඕකන්ගේ ආරම්භක ප්‍රකාශයෙන් අනතුරුව මිනිත්තු 45ක සජීවී ප්‍රශ්න-උත්තර සහිත සාකච්ඡාවක් පැවතුනි.

සසප බුෂ් හා කෙරී අතරින් කවරෙකුට හෝ වැඩි මනාපයක් දක්වන්නේ දැයි විමසූ කල එයට ප්‍රතිචාර දක්වමින් වැන් ඕකන් පැවසුවේ තමන් එසේ එක් අයෙකුට වැඩි මනාපයක් දක්වන්නේ නම් ජනාධිපතිවරනයට තරඟ නො කරන බව යි. බුෂ් හා කෙරී යන දෙදෙනා ම ඇමරිකානු මහ ව්‍යාපාරිකයන්ගේ ප්‍රකාශකයෝ ද ඉරාකයේ එක්සත් ජනපද වාඩිලෑමේ ආධාරකරුවෝ ද වෙති. කෙරී නැවත නැවතත් කියා ඇත්තේ තමන් ඉරාකයෙන් ඉවත් වීම සඳහා නො ව ඒ වෙනුවට යුද්ධය "ජය ගැනීම" වෙනුවෙන් පෙනී සිටින බවයි. ඊට ප්‍රතිකූලව සසප "ඉරාකය තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ පරාජය සඳහා පෙනී සිටී. ඒ මක් නිසා ද කිය තොත් එසේ නැති නම්, එක්සත් ජනපද ප්‍රභුව වාඩිලෑම සඳහා සෙසු රටවල් ඉලක්ක කර ගැනීමට තව දුරටත් දිරි ගැන්වෙනු ඇති බැවිනි." සභාවේ සිටි බොහෝ දෙනෙක් සිය එකඟතාව පල කරමින් හිස වැනූහ.

බුෂ්ගේ ත්‍රස්ත විරෝධී යුද්ධය සම්බන්ධයෙන් සසප දරන ආකල්පය ගැන විමසූ කල වැන් ඕකන් කියා සිටියේ එය ප්‍රෝඩාවක් බව යි. ඉරාකයේ තෙල් බිම් අල්ලා ගැනීම සහ මැද පෙරදිග හා කැස්පියන් මුහුදු

කලාපයේ තෙල් සංචිත පාලනය කල හැකි මූලෝපායික ස්ථානයකට එක්සත් ජනපදය ඔසවා තැබීම මගින් එහි ආර්ථික කඩා වැටීම වලකා ගනු වස් ඇමරිකානු මිලිටරි ශක්තිය යොදා ගැනීමේ එක්සත් ජනපද ප්‍රභූවේ දිගු කලක් පැවති සැලසුම් ක්‍රියාවට දමනු පිනිස කඩතුරාවක් ලෙස 2001 සැප්තැම්බර් 11 ත්‍රස්තවාදී ප්‍රහාර සේවය කොට තිබේ. ඔහු තව දුරටත් කියා සිටියේ "ත්‍රස්ත විරෝධී යුද්ධය, . . . ඇමරිකානු ජනතාව ත්‍රස්ත කිරීමට" රට තුල ප්‍රජාතන්ත්‍ර අයිතීන් මැඩීමට සහ අධිරාජ්‍යවාදී යුද්ධයට සහාය දෙනු පිනිස මහජනතාව බලහත්කාරයෙන් තල්ලු කිරීමට "යොදා ගැනෙන" බව යි.

සෝවියට් සංගමය බිඳ වැටී ඇති සහ චීන තන්ත්‍රය ධනවාදය වැලඳ ගෙන ඇති තතු යටතේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට විරුද්ධ විය හැක්කේ කෙසේ දැයි එක් වාර්තාකරුවෙක් ඇසී ය. එයට පිලිතුරු දෙමින් වැන් ඕකන් පැහැදිලි කලේ සෝවියට් ස්ටැලින්වාදී තන්ත්‍රය අධිරාජ්‍යවාදයට සාවද්‍ය ප්‍රතිභාරයක් බව ඔප්පු වී ඇති බව යි. කම්කරු පන්තියේ බලය උදුරා ගෙන තිබූ සෝවියට් නිලධරය අවසානයේ සිය වරප්‍රසාද රැක ගැනීමට උත්සාහ කලේ සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල ධනවාදය පුනස්ථාපනය කරන ඒජන්සිය ලෙස ක්‍රියා කිරීම මගිනි.

"යුරෝපීය ධනේශ්වරය හෝ ඊනියා සංවර්ධනය වන ලෝකයේ රටවල ජාතික ධනේශ්වරය හෝ ඇටුවම් බැහපු වෘත්තීය සමිති හා සම්ප්‍රදායික කම්කරු ව්‍යාපාර ගැන හෝ අපි කිසිදු විශ්වාසයක් නො තබමු. සඵල හා ස්ථිරසාර ලෙස අධිරාජ්‍යවාදයට එරෙහි විය හැකි එකම බලවේගය ජාත්‍යන්තර කම්කරු පන්තිය යි. සිය කොන්දේසි එක දිගට කඩා වැටීමකට මුහුන දී සිටින එක්සත් ජනපද කම්කරු පන්තිය ලෝක ධනවාදයට එරෙහි පොදු අරගලයක් තුල ලොව පුරා සිටින කම්කරුවන් සමග ඒකාබද්ධ කල හැකි ය, එසේ ඒකාබද්ධ කල යුතු ය."

"ඒක-ධ්‍රැව ලෝකයක්" පිලිබඳ සංකල්පය ගැන සසප දරන අදහස ගැන විමසූ කල එයට පිලිතුරු දෙමින් වැන් ඕකන් අවධාරනය කලේ, එක්සත් ජනපද ශක්තිය පිලිබඳ කියාපෑම් දැවැන්ත අධිතක්සේරුවක් බව යි. එක්සත් ජනපදය වඩ වඩා මිලිටරි බලය මත වාරු වීම ශක්තියේ නොව, ආර්ථික කඩා වැටීමේ සලකුනකි. එක්සත් ජනපදය දැන් ලෝකයේ විශාලතම නයගැති ජාතිය වන අතර එහි වාර්ෂික වෙලඳ හිඟය ඩොලර් බිලියන 600කි. එපමනක් නොව, ඉරාකය අල්ලා ගැනීමේ වොෂිංටනයේ ප්‍රයත්නය මුලුමනින් ම අසාර්ථක වී තිබේ.

එක්සත් ජනපදයේ සැබෑ ධ්‍රැවාන්තගත වීම පවත්නේ රිපබ්ලිකන්වරු හා ඩිමොක්‍රැටිකයන් අතර නොව, වැඩ කරන ජනතාවගෙන් සමන්විත අති මහත් බහුතරය සහ පටු, වඩ වඩා කෑදර දේශපාලනිකව හුදකලා බවට පත් වන මහ ව්‍යාපාරික ප්‍රභූවක් අතර ය. එක්සත් ජනපදය "දැවැන්ත අර්බුදයක ගිලුනු රටක්" බවට පත්ව ඇතැයි ඔහු අවධාරනය කලේ ය.

මෙම පිලිතුර තව දුරටත් මෙසේ ප්‍රශ්නයක් මතු කිරීමට තුඩු දුනි. එනම්, කම්කරු පන්තිය යුද්ධයට විරුද්ධ නම් ඔවුන්ගේ එම විරුද්ධත්වය මැතිවරන තුල ප්‍රකාශයක් අත් පත් කර නො ගන්නේ මන් ද යන්න යි. ඉරාක ආක්‍රමනයට පෙරාතු සති ගනනාව තුල, බුෂ් පරිපාලනය සහ පිට කොන්දක් නැති මාධ්‍ය සදාම් හුසේන්ගේ මහා ජන නාශක අවි හා අල් කයිඩා සබඳතා පිලිබඳ ගෙතු කතා මගින් යුද්ධය සඳහා සහයෝගය වගා කිරීමට ප්‍රයත්න දරමින් සිටි තතු යටතේ එක්සත් ජනපද ඉතිහාසය තුල පැවති විශාලතම යුද විරෝධී පෙලපාලි දක්නට ලැබුනු බව වැන් ඕකන් සඳහන් කලේ ය.

ද්වි-පක්ෂ ක්‍රමය, සංගත මගින් පාලනය වන මාධ්‍ය සහ මුලුමනින් ම ප්‍රජාතන්ත්‍ර විරෝධී මැතිවරන නීති යොදා ගනිමින් එක්සත් ජනපද ප්‍රභූව යුද්ධයේ විරුද්ධවාදීන්ගේ අදහස් නියෝජනය වීම වලකාලීමට කල හැකි සෑම දෙයක් ම කලේ ය. මෙම ප්‍රයත්නයේ දී ප්‍රභූව සමග හවුල් වී සිටියේ වෘත්තීය සමිති ය. "වෘත්තීය සමිති . . . ඒවායේ පැවති තත්වයේ සෙවනැලි බවට පත්ව ඇත. ඒවා රේගන් යටතේ ඇරඹුනු ප්‍රහාරවලට අභියෝග කිරීමෙහි ලා සිය නොහැකියාව ඔප්පු කර ඇති අතර තව මත් ඩිමොක්‍රැටික් පක්ෂය පිටුපස දෘඩතර ලෙස පෙල ගැසී සිටී." යැයි වැන් ඕකන් පැවසී ය.

එක්සත් ජනපදය අර්බුදවලින් ඉරිතලා ගොස් ඇතැයි ඔහු යලිත් අවධාරනය කලේ ය. එක්සත් ජනපදයේ ආර්ථික තත්වය අතිශය අස්ථාවර බවට පත්ව ඇති අතර වැඩ කරන ජනතාව රැඩිකලීකරනය වෙමින් අරගලවලට තල්ලු වෙමින් සිටිති. සසප උද්ඝෝෂනය සඳහා වැඩෙන සහයෝගය තුල මෙම තතු පිලිඹිබු වී තිබේ.

එක්සත් ජනපද කම්කරුවන් සම්බන්ධයෙන් සසප ඉදිරිපත් කරන පිලිවෙත්, දැවැන්ත ජංගම ගිනුම් හා වෙලඳ හිඟයන් ගොඩ ගැහෙන තතු යටතේ එක්සත් ජනපදය සිය පැවැත්ම ඉදිරියට ගෙන යාමට සමත්ව ඇත්තේ කෙසේ ද, පලස්තීන ජනතාවගේ අරගලය සම්බන්ධයෙන් සසප දරන ආකල්පය, එක්සත් ජනපද ආන්ඩුව හා සංගත මගින් පාලනය වන මාධ්‍ය අතර සන්ධානයේ ස්වභාවය සහ වෘත්තීය සමිතිවල ක්‍රියාකලාපය පිලිබඳව තව දුරටත් ප්‍රශ්න මතු කරන ලදි.

© www.wsws.org